# ආපද කළමනාකරණ අමාත්‍යාංශය
# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

# පුරප්පාඩු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## 1. විද්‍යාඥ ARI (ඉංජිනේරු / භූ විද්‍යාඥ/ ප්‍රමාණ සමීක්ෂක)

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, විශ්වවිද්‍යාලයකින් ලබාගත්, උචිත විෂය සංකලනයන් සහිතව, ඉංජිනේරු ශිල්පය/ විද්‍යාව/ භූ විද්‍යාඥ/ ප්‍රධාන සමීක්ෂක හෝ අදාළ ක්ෂේත්‍රයේ සිව් (4) අවුරුදු ප්‍රථම උපාධියක්.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, උචිත විෂයය සංකලනයන් සහිත විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයේ සිව් (4) අවුරුදු ප්‍රථම උපාධියක් සහ ඉංජිනේරු ශිල්පය/ විද්‍යාව/ භූ විද්‍යාඥ හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් / ඩිප්ලෝමාවක්.

**හෝ**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හෝ සමාන ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සැ. යු.** තනතුරට අදාළ පර්යේෂණාත්මක පළපුරුද්දක් සහිත වීම අමතර වාසියක් වනු ඇත

**වැටුප් පරිමාණය** : AR-1 රු. (51,285 - 1135 x 5 - 1335 x 5- 1590x15 - 87,485)

**මූලික පියවර** : රු. 30,037.00 + රුපියල් 9633.00 (ගැලපුම් දීමනාව)

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

## 2. තාක්ෂණ නිලධාරී JM - 1-1

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු විද්‍යාව/ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක උපාධියක්

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා (සුදුසුකම්) (NVQ) 07 (හත) මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමාව සමත්වීම හෝ සමාන සුදුසුකම් (NVQ) 6 මට්ටමට නොඅඩු (ජාතික වෘත්තීය කුසලතා) සුදුසුකම් සමඟ, රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද

**හෝ**

ජාතික තාක්ෂණවේද සහතිකය (NCT) හෝ (NVQ) (ජාතික වෘත්තීය කුසලතා) 5 මට්ටමට නොඅඩු සුදුසුකම් සමඟ රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : JM 1-1 රුපියල් (42,600-755x10 - 1135x18-70,580)

**මූලික පියවර** : රු. 24,940.00 + රු. 9690.00 (ගැලපුම් දීමනාව)

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ 45කට නොවැඩි විය යුතුය.

## 3. අධ්‍යක්ෂක ජනරාල්ගේ ලේකම් : JM 1-1 (තනතුර 01 යි)

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්.

**හෝ**

පිළිගත් රජයේ ආයතනයකින් ලබාගත් ලේකම්කරණ පරිචයත් පිළිබඳ ඩිප්ලෝමාවක් සමඟ වසර පහක (05) පශ්චාත් යෝග්‍යතා ලේකම්කරණ පළපුරුද්ද සහ ඉන් වසර තුනක් පිළිගත් ආයතනයක රහස්‍ය ලේකම් ලෙස ලත් පළපුරුද්දක් විය යුතුය.

**වැටුප් පරිමාණය** : JM 1-1 රු. (42,600-755x10-1135x18-70,580)

**මූලික පියවර** : රු. 24,940.00 + රු. 9690.00 (ගැලපුම් දීමනාව)

**වයස** : වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 4. කළමනාකරණ සහකාර (තාක්ෂණික) MA 2-2

**සුදුසුකම් :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ, ජාතික වෘත්තීය කුසලතා, 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හෝ රජයේ තාක්ෂණ (කාර්මික) විද්‍යාලයෙන් ලබාගත් ජාතික තාක්ෂණවේද සහතිකය (NCT) හෝ සමාන සුදුසුකම්.

**වැටුප්** : MA 2-2 රු. (30,310 - 300-10x350x7 - 600x4-710x20-52,360)

**මූලික පියවර** : 17,750.00 + රු. 9802.00 (ගැලපුම් දීමනාව)

**වයස** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තරික සුදුසුකම්වලට අනුරූපිව අභ්‍යන්තරික අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- ❒ ජීවන වියදම් දීමනාව.
- ❒ සංවිධානය විසින් සේවක අර්ථසාධක අරමුදලට 12% ක් සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3% ක් ද වශයෙන් දායක වනු ඇත.
- ❒ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.

සම්පූර්ණ ජීව දත්ත ප්‍රකාශ සහිත අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත්ද සමඟ **2016.10.14** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 05, ජාවත්ත පාරේ, අංක 99/1, හි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. කරුණාකර අයදුම්කරනු ලබන තනතුර, කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරනු මැනවි.

**අධ්‍යක්ෂක ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර,**
**කොළඹ 05.**